# සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ක්ෂේත්‍රය (SME ක්ෂේත්‍රය) සඳහා තිරසාර සංචාරක සහතිකකරණ ප්‍රදානයක් පිරිනැමීමේ අයදුම්පත - 2023

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය UNDP, ශ්‍රී ලංකා සමග එක්ව ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ක්ෂේත්‍රයට තිරසාර සංචාරක සහතිකකරණයට සහභාගී වන මෙන් ආරාධනා කරයි.

# පොදු උපදෙස්:

1. මෙම ඉල්ලුම් පත ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වන ජාතික තිරසාර සංචාරක සහතිකකරණය (NSTC) / යහපත් සංචාරක සහතිකකරණය (Good Travel certification) ලබා ගැනීම උදෙසා ප්‍රදානයක් පිරිනැමීම සඳහා වන ඉල්ලුම්පතකි. තෝරාගනු ලබන අයදුම්කරුවන් අදාළ වැදගත් සාක්ෂි ඉදිරිපත් කරමින් මාර්ගගතව ලියාපදිංචි විය යුතු බව ඉල්ලා සිටිනු ලැබේ.

   මෙම ඉල්ලුම්පතෙහි සපයා ඇති තොරතුරු සහතිකකරණ ක්‍රියාවලිය සඳහා බාහිර මූල්‍ය ආධාරවලින් ප්‍රතිලාභ ලැබිය හැකි ආයතන තෝරා ගැනීම සඳහා භාවිතා කරනු අතර එය කිසිදු ආයතනයක් තමන් විසින්ම සහතිකකරණය සඳහා අයදුම් කිරීම බැහැර නොකරයි.

2. NSTC | Good Travel Certification යනු ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) සහ Green Destinations (හරිත ගමනාන්තය) විසින් පිරිනමනු ලබන ඒකාබද්ධ සහතිකයකි.

3. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) යනු අමුත්තන් සඳහා කාමර 10 ක් දක්වා නවාතැන් පහසුකම් සහිත සහ පුද්ගලයන් 10 දෙනෙකු දක්වා සේවයේ නිරත වී සිටින ව්‍යවසායකි (ස්ථිර සහ ගිවිසුම්ගත)

4. මෙම ප්‍රදාන වැඩසටහනේ මූලික අරමුණ වනුයේ සංචාරක ක්ෂේත්‍රයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ තිරසාර බව ප්‍රවර්ධනය කිරීමයි. එබැවින්, මෙම ප්‍රදාන වැඩසටහන පරිසරයට එල්ල වන තර්ජන අවම කරමින් සංචාරක අංශයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ පරිසර හිතකාමී භාවිතයන් ප්‍රවර්ධනය කිරීම තුළින් ජෛව විවිධත්වය තිරසාර ලෙස භාවිතා කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් පාරිසරික අංශ කෙරෙහි ප්‍රමුඛත්වය ලබා දී තිබේ.

5. මෙම ඉල්ලුම්පතෙහි සඳහන් තොරතුරු වෙනත් කිසිම අරමුණුක් සඳහා භාවිතා නොකෙරේ. අයදුම්කරුවන් විසින් අයදුම්පත අධ්‍යයනය කර සාක්ෂි සහිතව නිවැරදි තොරතුරු සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ. අයදුම්පත සම්පූර්ණ කරන ආකාරය පිළිබඳව ඔබට පුහුණුවක් ලබා දෙනු ඇත.

   තවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සේවයේ නියැළී සිටින දිස්ත්‍රික් ප්‍රවර්ධන නිලධාරීන් සහ පළාත් සංචාරක කාර්යාලවල නම් කරන ලද නිලධාරීන් අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ඔබට සහාය වනු ඇත. මෙම කරුණ සඳහා සම්බන්ධ කර ගත හැකි පුද්ගලයින්ගේ ලැයිස්තුව ඇමුණුම මගින් ලබා දී තිබේ.

6. මෙම අයදුම්පත්‍රය පිරවීමෙන් ප්‍රදානය සඳහා හිමිකමක් ලැබුන බව කිසිවිටකත් නොසැලකේ. හිමිකම සඳහා කරනු ලබන තේරීම ස්වාධීන කමිටුවක් මගින් සිදු කෙරේ. මෙම වැඩසටහන විසින් තෝරාගත් අයදුම්කරුවන් සඳහා වසර දෙකක කාලයක් සඳහා NSTC / යහපත් සංචාර සඳහා සහතිකකරණ (Good Traveler Seal) ගාස්තු ගෙවනු ලැබේ. මීළඟ අලුත් කිරීම සඳහා එනම් 2 වන වසර අවසානයේ දී අයදුම්කරුවන් 3 වන සහ 4 වන වසර සඳහා තමන් විසින්ම සහතික කිරීමේ ගාස්තුව ගෙවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**අ. පරිපාලන තොරතුරු**

අ. යොමු අංකය :......................................................................................................................................

ආ. සම්පූර්ණ කළ දිනය :.............................................................................................................................

ආ. සම්පූර්ණ කළ දිනය :.............................................................................................................................

**ආ. තොරතුරු සපයන්නාගේ තොරතුරු.**

අ. නම :....................................................................................................................................................

ආ. ව්‍යාපාර හිමිකරුට ඇති සම්බන්ධය :.......................................................................................................

ඇ. ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍ර අංකය:.....................................................................................

ඈ. දුරකථන අංකය :.....................................................................................................................................

**ඇ. ව්‍යාපාර තොරතුරු.**

අ. ලියාපදිංචි ව්‍යාපාරයේ නම :...................................................................................................................

ආ. ව්‍යාපාරයේ වර්ගය :...............................................................................................................................

ඇ. ව්‍යාපාර ලියාපදිංචියේ විස්තර (ව්‍යාපාර ලියාපදිංචියේ ඡායා පිටපතක් අමුණන්න).

I. සමාගම් ලියාපදිංචිය :........................................................................................................................

II. පළාත් පාලන ලියාපදිංචිය :................................................................................................................

III. පළාත් සභා ලියාපදිංචිය :..................................................................................................................

IV. SLTDA ලියාපදිංචිය :........................................................................................................................

**ඈ. ව්‍යාපාරයේ හිමිකාරිත්වය (කරුණාකර අදාල ක්ෂේත්‍රය ඉදිරියෙන් හරි ලකුණක් යොදන්න)**

| | හවුල් ව්‍යාපාර | තනි පුද්ගල ව්‍යාපාර | බද්දට ලබා ගෙන තිබේ | කුලියට ලබාගෙන තිබේ |
|---|---|---|---|---|
| ව්‍යාපාරය | | | | |
| ස්ථානය | | | | |

**ඈ. පිහිටි ස්ථානයේ තොරතුරු.**

අ. දිස්ත්‍රික්කය :........................................................................................................................................

ආ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :.............................................................................................................

ඇ. ග්‍රාම නිලධාරී වසම :...............................................................................................................................

ඈ පිහිටි ස්ථානයේ ලිපිනය :.......................................................................................................................

ඉ. ආසන්නතම සංචාරක ගමනාන්තය / ක්‍රියාකාරකම් :...................................................................................

**ඉ. වෙනත් තොරතුරු.**

කරුණාකර ඔබගේ වර්තමාන භාවිතයන් එක් එක් නිර්ණායකවලට අනුව තක්සේරු කරන්න. මෙම නිර්ණායක සමඟ ඔබ මුළුමනින්ම අනුකූල නම් කරුණාකර 100% තෝරන්න. ඔබේ ආයතනය තුළ ඔබට එවැනි භාවිතයක් නොමැති නම්, ඔබ 25% තෝරාගත යුතුය. භාවිතාවේ මට්ටම අනුව, කරුණාකර සුදුසු ප්‍රතිශතයක් තෝරාගෙන අදාළ කොටුවේ **X** ලකුණ යොදන්න. ඔබ සතුව ලේඛනගත සාක්ෂි තිබේ නම්, අංක අනුපිළිවෙලට එම සාක්ෂි අමුණන්න. උදාහරණයක් ලෙස: ඇමුණුම 1 හි පළමු නිර්ණායක සඳහා සාක්ෂි, ඇමුණුම 2 හි දෙවන නිර්ණායක සඳහා සාක්ෂි යනාදි වශයෙන්. ලබා දී ඇති එකී නිර්ණායකයක් සඳහා ඔබට සාක්ෂි එකකට වඩා වැඩි සංඛ්‍යාවක් තිබේ නම් ඒවා 1.1, 1.2 ආදී ලෙස අංක කරන්න.

විස්තර කිරීමට ඔබෙන් ඉල්ලා සිටින විට දී ලබා දී ඇති හිස්තැන තුළ තත්ත්වය විස්තර කරන්න.

**ඊ. ඇගයීම් නිර්ණායක**

| නිර්ණායක අංකය | නිර්ණායක මාතෘකාව | 25% | 50% | 75% | 100% |
|---|---|---|---|---|---|
| 1 | **මිලදී ගැනීම සහ විකුණුම්, ආහාර සහ පාන වර්ග** | | | | |
| 1.1 | **වගකීම් සහිත පිරිනැමීම:** භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී සහ පිරිනැමීමේදී, ඒවා අදාල ප්‍රදේශයෙන් ලබාගැනීමට හැකි නම් සහ ඒවා ප්‍රමාණවත් හා ගුණාත්මක භාවයෙන් යුක්ත වන්නේ නම් සෑම විටම ප්‍රදේශයේ, පරිසර හිතකාමී සහ සාධාරණ වෙළඳ සැපයුම්කරුවන්ට සංවිධානය ප්‍රමුඛත්වය ලබා දෙයි. (ඔබ කරන දේ සාරාංශ කර උදාහරණ සපයන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අපි ප්‍රාදේශීයව එම ස්ථානයෙන්ම දේශීය ආහාර සහ පලතුරු, ද්‍රව්‍ය සහ සේවා මිලදී ගනිමු. | | | | |
| | ii. එළවළු සහ පලතුරු වැනි මූලික දේවල් බොහොමයක් අපේ අස්වැන්නෙන්ම ලබාගනිමු. | | | | |
| 1.2 | **පරිසර හිතකාමී මිලදී ගැනීම්:** විසින් ප්‍රාග්ධන භාණ්ඩ, ආහාර, පාන වර්ග, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ පරිභෝජන ද්‍රව්‍ය ඇතුළු පාරිසරික වශයෙන් තිරසාර සැපයුම්කරුවන් සහ නිෂ්පාදන සඳහා මිලදී ගැනීමේ ප්‍රතිපත්ති අනුග්‍රහය දක්වයි. (ඔබේ තිරසාර මිලදී ගැනීමේ ප්‍රතිපත්තිය සාරාංශ කර උදාහරණ සපයන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අපි අපේ ඇසුරුම්වල දී හැකිතාක් දුරට පොලිතින් සහ ප්ලාස්ටික් භාවිතය අවම කරමු. | | | | |
| | ii. අපගේ සැපයුම්කරුවන් පරිසර හිතකාමී ලෙස නිෂ්පාදනය සිදුකර ප්‍රවාහනය කරන බවට අපි සහතික වෙමු. | | | | |
| 1.3 | **කාර්යක්ෂම මිල දී ගැනීම:** නාස්තිය අවම කිරීම සඳහා ආහාර ඇතුළු පරිභෝජන සහ ඉවත දැමිය හැකි භාණ්ඩ මිලදී ගැනීම ප්‍රවේශමෙන් කළමනාකරණය කරයි. (අපද්‍රව්‍ය අවම කිරීම සඳහා ඔබේ මිලදී ගැනීමේ ප්‍රතිපත්තිය/ භාවිතයන් විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අපි භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී අපද්‍රව්‍ය හා දූෂණය අවම කිරීම ගැන සලකා බලමු. | | | | |
| 1.4 | **හොඳ ආහාර පිරිනැමීම:** ඉල්ලීම මත නිර්මාංශ, සත්ත්ව ආහාර වලින් තොර, ග්ලූටන්-රහිත, කිරි රහිත සහ වෙනත් විශේෂ ආහාර විකල්ප පිරිනමයි. (ඉදිරිපත් කර ඇති ආහාර විකල්ප විස්තර කර උදාහරණ සපයන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අපි සෞඛ්‍යය, සමාජීය, ආගමික සහ වෙනත් ඉල්ලීම් මත පදනම්ව ආහාර විකල්ප පිළිගනිමින් ඒවාට ගරු කර, ලබා ගැනීමට ඉඩ සලස්වමින්, ඒ පිළිබඳ දැනුම් දී ලබා දීමට කටයුතු කරමු. | | | | |
| 1.5 | **හොඳ ආහාර පිළිබඳ තොරතුරු:** කුමන ආහාර සහ පාන විකල්ප දේශීය ද සහ සාධාරණ වෙළෙඳාමට අයත් ද, නිර්මාංශ ද, සත්ත්ව ආහාර වලින් තොර ද හෝ කාබනික ද යන්න සන්නිවේදනය කරයි. (ඔබ ආහාර සහ පාන වර්ග විකල්ප සන්නිවේදනය කරන ආකාරය විස්තර කරන්න. එමෙන්ම අදාළ නම් වෙබ් පිටුවට සබැඳියක් එක් කරන්න. කරුණු තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුනන්න.) | | | | |
| | i. සෞඛ්‍යය සමාජීය ආගමික සහ වෙනත් ඉල්ලීම් මත පදනම්ව පවතින ආහාර විකල්ප පිළිගනිමින් ඒවාට ගරු කරමින්, සන්නිවේදනය කරමු. (නිර්මාංශ මෙනුව ආදිය) | | | | |

| නිර්ණායක අංකය | නිර්ණායක මාතෘකාව | 25% | 50% | 75% | 100% |
|---|---|---|---|---|---|
| 1.6 | **මස් පරිභෝජනය අඩු කිරීම:** මස් නිෂ්පාදන පිරිනැමීම/මිලදී ගැනීම අඩු කිරීමට මුලපුරන වඳවීමේ තර්ජනයට ලක්ව ඇති මාළු, මුහුදු ආහාර හෝ වෙනත් විශේෂවලින් සැකසූ නිෂ්පාදන ලබා නොදේ. මස් ආශ්‍රිත නිෂ්පාදන පරිභෝජනය අඩු කිරීමට ඔබ සතු ප්‍රවේශය විස්තර කරන්න. කරුණු තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න. | | | | |
| | i. ප්‍රතිපත්තියක් ලෙස අපි වඳවීමේ තර්ජනයට ලක්ව ඇති මාළු, මුහුදු ආහාර හෝ වෙනත් විශේෂ සහ නීති විරෝධී දඩයම් මස් වලින් සැකසූ ආහාර හෝ වෙනත් නිෂ්පාදන ලබා නොදෙන්නෙමු. | | | | |
| | ii. මස් මත පදනම් වූ ආහාර සහ ආවේණික සහ වඳවීමේ තර්ජනයට ලක්ව ඇති විශේෂවල ආහාර පිරිනැමීමේ පාරිසරික බලපෑම අපි දනිමු. | | | | |
| 1.7 | **දේශීය කලා සහ අත්කම් නිර්මාණ:** දේශීය කලා/අත්කම් නිර්මාණ සහ ගෘහ භාණ්ඩවලින් පිළිබිඹු වේ. (භාවිතා කරන ලද දේශීය චිත්‍ර සහ අත්කම් නිර්මාණ සහ එය ලබා ගත් ආකාරය විස්තර කරන්න. කරුණු තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඔබ ඔබේ ව්‍යාපාරය සඳහා කොතෙක් දුරට දේශීය කලා/ශිල්ප/නිෂ්පාදන භාවිත කර තිබේද? | | | | |
| **2** | **සමාජ යහපැවැත්ම** | | | | |
| 2.1 | **නෛතික අනුකූලතාවය:** සෞඛ්‍ය, ආරක්ෂාව, කම්කරු සහ පාරිසරික අංශ ඇතුළුව අදාළ වන සියලුම දේශීය, ජාතික සහ ජාත්‍යන්තර නීති සහ රෙගුලාසි වලට අනුකූල වේ. (ඔබ සියලු නීති සහ රෙගුලාසිවලට අනුකූලද යන්න සඳහන් කරන්න, අදාළ වන්නේ නම්, අනුකූල නොවන අවස්ථා විස්තර කරන්න. කරුණු තහවුරු කිරීම සඳහා පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. මෙම ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා ජාතික/පළාත් සහ ප්‍රාදේශීය මට්ටමෙන් තිබෙන්නා වූ නීතිමය අවශ්‍යතා පිළිබඳව අපි දැනුවත්ව සිටිමු. | | | | |
| | ii. මෙම ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා ජාතික/පළාත් සහ ප්‍රාදේශීය මට්ටමෙන් තිබෙන්නා වූ නීතිමය අවශ්‍යතා පිළිබඳව අපි දැනුවත්ව සිටිමු. | | | | |
| 2.2 | **වගකීම් සහගත සමාජ දායකත්වය:** ප්‍රාදේශීය යටිතල පහසුකම් සහ සමාජ ප්‍රජා සංවර්ධනය සඳහා වන මුලපිරීම් සඳහා ක්‍රියාකාරීව සහාය දක්වයි. අධ්‍යාපනය, පුහුණුව, සෞඛ්‍ය සහ සනීපාරක්ෂාව, සහ දේශගුණික විපර්යාසවල බලපෑම් ආමන්ත්‍රණය කරන ව්‍යාපෘති මුලපිරීම් උදාහරණ ලෙස දැක්විය හැක. සමාජ ගැටුම් - කුලය/පංතිය ඇතුලත් නොවේ. (ඔබ කරන දේ සාරාංශ කර අදාළ නම් වෙබ් පිටු වෙත සබැඳි ඇතුළුව උදාහරණ සපයන්න. කරුණු තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. පසුගිය වසර දහය තුළ (CSR) ප්‍රාදේශීය යටිතල පහසුකම් සහ සමාජ ප්‍රජා සංවර්ධනය සඳහා වන මුලපිරීම් සඳහා ඔබ කර ඇති දේ විස්තර කරන්න. | | | | |

| නිර්ණායක අංකය | නිර්ණායක මාතෘකාව | 25% | 50% | 75% | 100% |
|---|---|---|---|---|---|
| 2.3 | **ප්‍රජා සේවා:** අසල්වැසි ප්‍රජාවන්ට ආහාර, ජලය, බලශක්තිය, සෞඛ්‍ය සේවා හෝ සනීපාරක්ෂාව වැනි මූලික සේවාවන් සැපයීමේ ක්‍රියාකාරකම් අනතුරේ නොහෙළයි. (තත්වය විස්තර කරන්න. අදාළ නම් කරුණු තහවුරු කරන පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ සිත කළඹන සහ ඔවුන් අතර ගැටුම් ඇති ඇති කරන ස්වභාවික සම්පත් අපි ඕනෑවට වඩා භාවිතා නොකරමු. | | | | |
| | ii. අපි පොදු ප්‍රදේශ/සම්පත් වෙත මහජනයා ප්‍රවේශ වීමට ඇති ස්ථාන පුද්ගලිකව භාවිතා කරමින් බාධා ඇති නොකරමු. | | | | |
| 2.4 | **ප්‍රාදේශීය ජීවනෝපායන්:** ඉඩම් සහ ජලජ සම්පත් භාවිතය, මාර්ග අයිතිය, ප්‍රවාහනය සහ නිවාස ඇතුළු ජීවනෝපායන් සඳහා ප්‍රාදේශීය ජනයාට ඇති ප්‍රවේශය සඳහා ක්‍රියාකාරකම් අහිතකර ලෙස බලපාන්නේ නැත. (තත්ත්වය විස්තර කරන්න. අදාළ නම් තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අපි පොදු ප්‍රදේශ/සම්පත් වෙත මහජනයා ප්‍රවේශ වීමට ඇති ස්ථාන පුද්ගලිකව භාවිතා කරමින් බාධා ඇති නොකරමු. | | | | |
| 2.5 | **ස්වේච්ඡාවෙන් නැවත පදිංචි කිරීම:** දේපල අත්පත් කර ගැනීම සහ ව්‍යාප්ත කිරීම පදිංචිකරුවන් ස්වේච්ඡාවෙන් නැවත පදිංචි කිරීමට හේතු වී නොමැත. (තත්ත්වය විස්තර කරන්න. අදාළ නම් කරුණු තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ව්‍යාපාරික ස්ථාන සම්බන්ධයෙන් ඉඩම් හා දේපල පිළිබඳ ගැටළු නොමැත. | | | | |
| | ii. ව්‍යාපාර/ව්‍යාපාරික ස්ථාන හේතුවෙන් නැවත පදිංචි කිරීම් සිදුවී නොමැත. | | | | |
| 2.6 | **පදිංචිකරුවන් විසින් සත්කාරකත්වය සපයනු ලබන අමුත්තන්:** B&B හි සත්කාරකවරයා මහල් නිවාසයේ පදිංචි වී සිටියි / සංචාරකයින්ට සම්පූර්ණයෙන්ම කුලියට දී නොමැත. (තත්වය විස්තර කරන්න. අදාළ නම් කරුණු තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අදාළ වන්නේ නිවසේ නවාතැන් ගන්නා (Homestay) කාණ්ඩයට පමණි | | | | |
| 2.7 | **ප්‍රාදේශීය හිමිකම:** හිමිකරු ව්‍යාපාරයට ක්‍රියාකාරීව සහභාගී වන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. (තත්වය විස්තර කරන්න. අදාළ නම් කරුණු තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ව්‍යාපාර හිමිකරු එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේම අයෙකි. | | | | |
| 2.8 | **ප්‍රාදේශීය ව්‍යවසායකයින්:** ප්‍රදේශයේ ස්වභාවය, ඉතිහාසය සහ සංස්කෘතිය මත පදනම් වූ තිරසාර නිෂ්පාදන සහ සේවා සංවර්ධනය කිරීම සහ විකිණීම සඳහා ප්‍රාදේශීය ව්‍යවසායකයින්ට සහාය වේ. (ඔබ කරන දේ සාරාංශ කර උදාහරණ සපයන්න. කරුණු තහවුරු කරන පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අපගේ ව්‍යාපාරය දේශීය නිෂ්පාදනයට සහ සැපයුම් දාමයේ ව්‍යාපාරවලට සහය දක්වයි. | | | | |

| නිර්ණායක අංකය | නිර්ණායක මාතෘකාව | 25% | 50% | 75% | 100% |
|---|---|---|---|---|---|
| 2.9 | **ගමනාන්තයේ කටයුතුවලට සම්බන්ධවීම:** ගමනාන්තයේ තිරසාර සංචාරක සැලසුම්කරණය සහ කළමනාකරණය සඳහා අවස්ථාවන් පවතී නම් ඒ සමඟ සම්බන්ධ වේ. (ඔබ කරන දේ සාරාංශ කර උදාහරණ සපයන්න. කරුණු තහවුරු කරන පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ගමනාන්තයේ කටයුතුවලට සම්බන්ධවීම: ගමනාන්තයේ තිරසාර සංචාරක සැලසුම්කරණය සහ කළමනාකරණය සඳහා අවස්ථාවන් පවතී නම් ඒ සමඟ සම්බන්ධ වේ. (ඔබ කරන දේ සාරාංශ කර උදාහරණ සපයන්න. කරුණු තහවුරු කරන පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| 2.10 | **ගමනාන්තයේ කටයුතුවලට සම්බන්ධවීම - නාවික සංචාරක ක්‍රියාකරුවන්:** තිරසාර සංචාරක සැලසුම්කරණය සමග සහ සංචාරය කරනු ලබන ගමනාන්තවල කළමනාකරණය සමඟ සම්බන්ධ වී කටයුතු කිරීමෙන් ගමනාන්තයට සහ එහි ප්‍රාදේශීය ප්‍රජාවන්ට ඇතිවිය හැකි අහිතකර සංස්කෘතික හා සමාජ-ආර්ථික බලපෑම් වළක්වයි. නරඹන්නන් විශාල වශයෙන් පැමිණෙන තත්වයක් තුළ සත්කාරකත්වය සැපයීම සඳහා සංචාරය කරන ගමනාන්තවල දක්නට ලැබෙන ප්‍රාදේශීය යටිතල පහසුකම්වල අවශ්‍ය ධාරිතාව ඇති බව සහතික කරයි. (ඔබ කරන දේ සාරාංශ කර උදාහරණ සපයන්න. කරුණු තහවුරු කරන පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| 2.11 | **ප්‍රදේශයේ ශිෂ්‍යයින් සඳහා සීමාවාසික පුහුණුව:** ප්‍රාදේශීය සිසුන්ට සීමාවාසික පුහුණුව ලබා දෙයි. (ලබා දෙනු ලැබූ සීමාවාසික පුහුණුව විස්තර කරන්න. තහවුරු කරන පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අපි ප්‍රදේශයේ සිසුන්ට/ප්‍රජාවට පුහුණු අවස්ථා ලබා දෙන්නෙමු (විස්තර කරන්න) | | | | |
| **3** | **යහපත් රැකියාවක්** | | | | |
| 3.1 | **මානව සූරාකෑමක් නොමැත:** වාණිජ, ලිංගික හෝ වෙනත් ඕනෑම ආකාරයක සූරාකෑමකට හෝ හිරිහැරයකට එරෙහිව ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර ඇත. (ඔබේ ප්‍රතිපත්තිය සහ එය බලාත්මක කරන ආකාරය සාරාංශ කරන්න. කරුණු තහවුරු කරන පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අපි ප්‍රතිපත්තියක් ලෙස බාලවයස්කාර ළමයින් සේවයේ යොදවන්නේ නැත. | | | | |
| | ii. ප්‍රතිපත්තියක් ලෙස, අපි කාන්තා සේවිකාවන් සඳහා ආරක්ෂාව සහ රැකවරණය සහතික කරමු. | | | | |
| 3.2 | **යහපත් රැකියාවක්:** කම්කරු අයිතිවාසිකම්වලට ගරු කරන අතර ආරක්ෂිත සහ සුරක්ෂිත සේවා පරිසරයක් සපයමින් සේවකයින්ට අවම ජීවන වැටුපක් ගෙවනු ලැබේ. (කම්කරු අයිතිවාසිකම් සහ එය බලාත්මක කරන ආකාරය පිළිබඳ ඔබේ ප්‍රතිපත්තිය සාරාංශ කරන්න. කරුණු තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අපි සේවකයින් සඳහා සේවක අර්ථසාධක අරමුදල් (EPF) සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල (ETF) ලබා දෙන්නෙමු. | | | | |
| | ii. සේවා ස්ථානයේ සේවකයින්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සඳහා සෞඛ්‍ය සහ ආරක්ෂක මාර්ගෝපදේශ සහ අදාළ උපකරණ/ද්‍රව්‍ය අපි විසින් සපයා ඇත. | | | | |

| නිර්ණායක අංකය | නිර්ණායක මාතෘකාව | 25% | 50% | 75% | 100% |
|---|---|---|---|---|---|
| 3.3 | **ප්‍රාදේශීය රැකියා:** කළමනාකරණ තනතුරු ඇතුළු රැකියා සහ උසස්වීම් සඳහා ප්‍රදේශවාසීන්ට සමාන අවස්ථා ලබා දී ඇත. (ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ රැකියා සම්බන්ධ ඔබේ ප්‍රතිපත්තිය විස්තර කරන්න. එමෙන්ම දැනට සිටින සේවකයන්ගෙන් කී දෙනෙක් ප්‍රදේශවාසීන් ද යන්න සඳහන් කරන්න. කරුණු තහවුරු කරනු ලබන පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. රැකියා කාණ්ඩයට අනුව ලිංග භේදය/වයස/ආබාධිතභාවය ආදිය ඇතුළුව විස්තරාත්මකව ඔබේ ව්‍යාපාරයේ ප්‍රදේශවාසීන්ගේ සේවක ප්‍රතිශතය (උදාහරණ: මැද පෙළ කළමනාකරණය -50% කාන්තා) | | | | |
| 3.4 | **සමාන රැකියා අවස්ථා:** ස්ත්‍රී පුරුෂ භාවය, ජාතිය, ආගම, ආබාධිත හෝ වෙනත් ආකාරවලින් වෙනස් කොට සැලකීමකින් තොරව කළමනාකරණ තනතුරු ඇතුළු රැකියා අවස්ථා පිරිනමයි. (සමාන රැකියා අවස්ථා සම්බන්ධ ඔබේ ප්‍රතිපත්තිය සාරාංශ කරන්න.කරුණු තහවුරු කරන පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ස්ත්‍රී පුරුෂ භාවය, ජාතිය, ආගම, ආබාධිත හෝ වෙනත් බෙදීම්වලට අදාළව අපගේ ව්‍යාපාරයේ විවිධ කාණ්ඩවල සේවකයින්ගේ ප්‍රතිශතය | | | | |
| 3.5 | **පුහුණුව:** සේවකයින්ට නිතිපතා පුහුණුව, පළපුරුද්ද සහ උසස්වීම් සඳහා අවස්ථාවන් පිරිනමනු ලැබේ. (සේවකයින්ට ලබා දෙන පුහුණුව සහ අනෙකුත් අවස්ථා විස්තර කර උදාහරණ සපයන්න. කරුණු සනාථ කල හැකි පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. පසුගිය වසර කිහිපය තුළ ඔබ සේවකයින් සඳහා ලබා දී ඇති පුහුණු අවස්ථා ගණන විස්තර කරන්න. | | | | |
| | ii. සේවකයින්ගේ ස්ත්‍රී පුරුෂ භාවය/වයස/ සහ රැකියාව මත පදනම්ව ඔවුන්ට ලබා දී ඇති පුහුණු අවස්ථා ප්‍රතිශතය විස්තර කරන්න. | | | | |
| 3.6 | **සේවක රක්ෂණය:** සෞඛ්‍ය ආරක්ෂණය සහ සමාජ ආරක්ෂණය සඳහා සේවක කොන්ත්‍රාත්තු සහාය දක්වයි. (සේවක කොන්ත්‍රාත්තු/ සෞඛ්‍ය ආරක්ෂණය සහ සමාජ ආරක්ෂණය සඳහා සහාය වන ආකාරය විස්තර කරන්න. සේවක කොන්ත්‍රාත්තුවක හෝ රක්ෂණ ඔප්පුවක පිටපතක් අමුණන්න.) | | | | |
| | i. රැකියාව හරහා සපයනු ලබන සමාජ ආරක්ෂණ සහ සෞඛ්‍ය රක්ෂණ සහාය විස්තර කරන්න | | | | |
| 3.7 | **සේවක යහපැවැත්ම:** පැමිණිලි කළමනාකරණය කිරීම සඳහා ක්‍රමයක් හඳුන්වාදී සේවකයින්ගේ ශාරීරික හා මානසික ආතතිය වැලැක්වීමේ මාර්ග කෙරෙහි අවධානය යොමු කරයි. සේවකයින්ට නිතිපතා විවේකයක් ඇති අතර වැඩිපුර පැය ගණනක් වැඩ නොකරයි. (ඔබ සේවක යහපැවැත්ම සහතික කරන ආකාරය විස්තර කර උදාහරණ සපයන්න. කරුණු තහවුරු කරන පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |

| නිර්ණායක අංකය | නිර්ණායක මාතෘකාව | 25% | 50% | 75% | 100% |
|---|---|---|---|---|---|
| 3.8 | සේවකයින් කටයුතුවල නිරත වීම: තිරසාර කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමෙහි සේවකයින් නිරත වන අතර එය සිදුකිරීමේ දී ඔවුන්ගේ කාර්යයන් සහ වගකීම් පිළිබඳව වරින් වර මග පෙන්වීම සහ පුහුණුව ලබා ගනී. (තිරසාර කළමනාකරණ පද්ධතිය සමඟ සේවකයින් නියැලී සිටින ආකාරය විස්තර කරන්න. කරුණු තහවුරු කරන පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. තිරසාර කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමෙහි සේවකයින් නියැලීමේ මට්ටම සහ එය සිදුකිරීමේ දී ඔවුන්ගේ කාර්යයන් සහ වගකීම් පිළිබඳව වරින් වර මග පෙන්වීම සහ පුහුණුව ලබා ගැනීම | | | | |
| **4** | **සෞඛ්‍යය සහ ආරක්ෂාව** | | | | |
| 4.1 | **සෞඛ්‍යය සහ ආරක්ෂාව සහතික කිරීම:** කිසිවිටෙකත් සෞඛ්‍ය හෝ ආරක්ෂාව හා සම්බන්ධ උවදුරු ඇති කරනු නොලැබේ. සියළුම අවදානම් සාධක හඳුනාගෙන ඒවාට පිළියම් යොදනු ලැබේ. (පවතින තත්වය සහ ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග විස්තර කරන්න. කරුණු තහවුරු කරන පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. සේවා ස්ථාන තුළ සෞඛ්‍ය සහ ආරක්ෂිත උපද්‍රව ඇති විය හැකි හේතු අප විසින් හඳුනාගෙන ඇත (සෞඛ්‍ය හා ආරක්ෂිත ප්‍රතිපත්ති තිබීම සහ සේවා ස්ථානයේ ප්‍රදර්ශනය කිරීම) | | | | |
| | ii. සේවා ස්ථාන (ආරක්ෂිත උපකරණ සැපයීම) තුළ සෞඛ්‍ය සහ ආරක්ෂිත උපද්‍රව සඳහා ඇති අවස්ථාවන් අවම කිරීමට අප පියවර ගෙන ඇත. | | | | |
| 4.1 අ | ස්වාභාවික විපත් අවම කිරීමේ සහ සූදානම් වීමේ පියවරයන් ගෙන තිබීම | | | | |
| | i. පසුගිය පස් වසර තුළ ඔබේ ප්‍රදේශයේ ඇති වූ ස්වභාවික විපත් මොනවාද? | | | | |
| | ii. ඔබේ ව්‍යාපාරික ස්ථානය කිසියම් ස්වාභාවික ව්‍යසනයන්ට නිරාවරණය වී තිබේද? එමෙන්ම ආපදා අවම කිරීම සඳහා ඔබට පූර්ව සැලැස්මක් තිබේද? එසේ නම් ඒවා විස්තර කරන්න. | | | | |
| | iii. ඔබගේ ව්‍යාපාරික ස්ථානයට NBRO සහතිකය තිබිය යුතු ද? | | | | |
| 4.2 | **ආරක්ෂිත ස්ථානය:** පිහිටා තිබෙන ස්ථානය සහ ආසන්න වටපිටාව ආරක්ෂිතය, උදා. ආරක්ෂකයින්, ආරක්ෂක කැමරා, නිරීක්ෂණ, අගුලු යනාදිය. (සලසා ඇති ආරක්ෂිත පියවර ලැයිස්තුගත කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |

| නිර්ණායක අංකය | නිර්ණායක මාතෘකාව | 25% | 50% | 75% | 100% |
|---|---|---|---|---|---|
| 4.3 | **හදිසි අවස්ථා ක්‍රියාපටිපාටි:** උදාහරණ ලෙස ප්‍රථමාධාර, ආරක්ෂක පුහුණුව සහ හදිසි පිටවීම් වැනි කරුණු සම්බන්ධයෙන් හදිසි ක්‍රියා පටිපාටිය ස්ථාපිත කර ඇත. (ඔබේ ක්‍රියාපටිපාටි සහ පුහුණුව සාරාංශ කර දක්වන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඔබේ ව්‍යාපාරික ස්ථානය ආපදා අවදානම් ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන තිබේ නම්, ඔබ ඒ පිළිබඳව කිසියම් දැනුම්දීමක් ප්‍රදර්ශනය කර තිබේද? | | | | |
| 4.4 | **වෛරස් පිළිබඳ දැනුවත් කිරීම:** වෛරස් සම්ප්‍රේෂණයට එරෙහිව නීත්‍යානුකූලව අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරයි (විශේෂ පරීක්ෂාවකින් පසු වෛරස් පිළිබඳ දැනුවත් මුද්‍රාව නමැති සහතිකකරණය ලබා ගත හැක) (ක්‍රියාපටිපාටි සහ පියවර සාරාංශ කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න. | | | | |
| | i. වෛරස් සම්ප්‍රේෂණයට එරෙහිව නීත්‍යානුකූලව අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග අපි ක්‍රියාත්මක කරමු. | | | | |
| 4.5 | **පිහිනුම් තටාකය:** පිහිනුම් තටාකයේ ජලයේ ගුණාත්මකභාවය සහ ආරක්ෂාව නිතිපතා පරීක්ෂා කරයි. (ජලයේ ගුණාත්මකභාවය සහ ආරක්ෂාව නිරීක්ෂණය කරන ආකාරය විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ජලයේ ගුණාත්මකභාවය සහ පිහිනුම් තටාකවල ආරක්ෂාව සඳහා නිරන්තර පරීක්ෂාවන් සිදු කරමු. | | | | |
| 4.6 | **කිමිදුම්කරු එදිරිව කිමිදුම් මාස්ටර් අනුපාතය:** කිමිදුම්කරු එදිරිව කිමිදුම් මාස්ටර් අනුපාතය දිය යට කිමිදුම්කරුවන්ගේ හැසිරීම් නිසි සහ වගකීමෙන් අධීක්ෂණය කරන බව සහතික කරයි. (අනුපාතය තීරණය කරන ආකාරය සහ දිය යට කිමිදුම්කරුවන් නිරීක්ෂණය කරන ආකාරය පැහැදිලි කරන්න. කරුණු තහවුරු වන පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඔබ එවැනි සේවාවන් සපයන්නේ නම්, කරුණාකර ඉහත කරුණු විස්තර කරන්න. | | | | |
| **5** | **ප්‍රවේශය** | | | | |
| 5.1 | **සැමට ප්‍රවේශය:** අදාල අවස්ථාවලදී විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් සඳහා ප්‍රවේශය සහ තොරතුරු සපයනු ලැබේ. (විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් සඳහා ප්‍රවේශය සහ තොරතුරු සපයන ආකාරය විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. භෞතික ප්‍රවේශ පහසුකම් (බෑවුම, සංඥා පුවරු ආදිය) අප විසින් සකස් කර ඇත. | | | | |
| | ii. ආබාධ සහිත පුද්ගලයින් සඳහා පරිශ්‍රය තුළ පහසුකම් (වැසිකිළි, සංඥා පුවරු ආදිය) අප විසින් සකස් කර ඇත. | | | | |

| නිර්ණායක අංකය | නිර්ණායක මාතෘකාව | 25% | 50% | 75% | 100% |
|---|---|---|---|---|---|
| 5.2 | **වෙනස් කොට නොසැලකීම:** ප්‍රාදේශීය ප්‍රජාවන්ට ගරු කරමින් ස්ත්‍රී පුරුෂ භාවය, ජාතිය, ආගම, සංස්කෘතිය, ආබාධිතභාවය යනාදී වෙනස්කම්වලින් තොරව සියලුම අමුත්තන් සාදරයෙන් පිළිගනී. (අමුත්තන්ට වෙනස්කම් නොකිරීම සම්බන්ධයෙන් ඔබේ ප්‍රතිපත්තිය සාරාංශ කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |
| 5.3 | **ප්‍රවාහනය:** ප්‍රවාහන අවශ්‍යතා අඩු කිරීමට උත්සාහ කරන අතර පාරිභෝගිකයින්, සේවකයින්, සැපයුම්කරුවන් විසින් සහ තමන්ගේම ක්‍රියාකාරකම් වලදී පිරිසිදු හා වඩා කාර්යක්ෂම විකල්ප සම්පත් භාවිතා කිරීම ක්‍රියාකාරීව දිරිමත් කරයි (උදා: ප්‍රදේශයේ පොදු ප්‍රවාහන පහසුකම් පිළිබඳ දැනුම් දීම)<br><br>(ප්‍රවාහන අවශ්‍යතා අඩු කරන ආකාරය සහ තිරසාර ප්‍රවාහන විකල්ප ප්‍රවර්ධනය කරන ආකාරය විස්තර කරන්න. අදාළ නම් වෙබ් පිටුවට සබැඳිය ඇතුළත් කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |
| 5.4 | **ප්‍රවේශ්‍යතාව පිළිබඳ තොරතුරු:** ප්‍රවේශ්‍යතා මට්ටම පිළිබඳ පැහැදිලි සහ නිවැරදි තොරතුරු සපයනු ලැබේ. (ප්‍රවේශ්‍යතාව පිළිබඳ තොරතුරු සපයන ආකාරය විස්තර කරන්න. අදාළ නම් වෙබ් පිටුවට සබැඳිය ඇතුළත් කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |

| නිර්ණායක අංකය | නිර්ණායක මාතෘකාව | 25% | 50% | 75% | 100% |
|---|---|---|---|---|---|
| 5.5 | **දේපල අයිතිවාසිකම් සහ ප්‍රවේශයඃ** දේපල සතු ඉඩම් සහ ජල අයිතිවාසිකම් අත්පත් කර ගැනීම නීත්‍යානුකූල වන අතර ඔවුන්ගේ නිදහස්, පූර්ව සහ දැනුවත් කැමැත්ත ඇතුළුව ප්‍රාදේශීය වාර්ගික සහ ප්‍රාදේශීය අයිතිවාසිකම්වලට අනුකූල වේ. ඉඩම් සහ ජලය ඇතුළු ප්‍රධාන සම්පත් භාවිතා කිරීමට සහ ප්‍රවේශ වීමට ඇති අයිතිවාසිකම් අදාළ වන විට ලේඛනගත කර ඇත. (ඔබේ දේපළ සහ ප්‍රධාන සම්පත් අත්පත් කර ගැනීමේ සහ ප්‍රවේශ වීමේ අයිතිය සම්බන්ධයෙන් ඔබේ ප්‍රතිපත්තිය සාරාංශ කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න .) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |
| 5.6 | වෙරළ තීරයන්, ජල තීරයන් සහ රක්ෂිත වැනි ස්වභාවික සම්පත් නීති විරෝධී ලෙස ආක්‍රමණය කිරීමෙන් සහ අත්පත් කර ගැනීමෙන් වැළකීම. | | | | |
| | i. දේපල ඉදිකිරීමේදී හෝ නඩත්තු කිරීමේදී අපි වෙරළ තීර, ජල තීර සහ රජයේ රෙගුලාසි යටතේ ප්‍රකාශයට පත් කර ඇති රක්ෂිත වැනි ස්වභාවික සම්පත් නීති විරෝධී ලෙස ආක්‍රමණය කිරීම සහ අත්පත් කර ගැනීමක් සිදු කර නොමැත. | | | | |
| | ii. ව්‍යාපාර කටයුතු සිදු කිරීමේදී අපි වෙරළ තීර, ජල තීර සහ රජයේ රෙගුලාසි යටතේ ප්‍රකාශයට පත් කර ඇති රක්ෂිත වැනි ස්වභාවික සම්පත් නීති විරෝධී ලෙස ආක්‍රමණය කිරීම සහ අත්පත් කර ගැනීමක් අප සිදු කර නොමැත. | | | | |

| නිර්ණායක අංකය | නිර්ණායක මාතෘකාව | 25% | 50% | 75% | 100% |
|---|---|---|---|---|---|
| 6 | **බලශක්තිය සහ දේශගුණය** | | | | |
| 6.1 | **දේශගුණ හිතකාමී:** බලශක්ති පරිභෝජනය අවම කරන අතර ශක්තිය නාස්ති නොකරයි (උදා: එළිමහනේ ටෙරස් හීටර් නොමැත) (බලශක්ති පරිභෝජනය අඩු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග විස්තර කරන්න. තහවුරු කිරීමේ පිංතූර සහ ලේඛණ අමුණන්න) | | | | |
| | i. ව්‍යාපාර පරිශ්‍රය තුළ බලශක්ති පරිභෝජනය අවම කිරීමට සහ බලශක්ති නාස්තිය අවම කිරීමට ගෙන ඇති පියවර මොනවාද? | | | | |
| | ii. බලශක්ති පරිභෝජනය අවම කිරීමට සහ බලශක්ති නාස්තිය අවම කිරීමට ව්‍යාපාරික පරිශ්‍රයෙන් පිටත ඔබ කිසියම් ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද? | | | | |
| 6.2 | **බලශක්ති පරිභෝජනය:** බලශක්ති පරිභෝජනය බලශක්ති (වර්ගය) ප්‍රභවය අනුව මනිනු ලබන අතර සමස්ත පරිභෝජනය අවම කිරීමට පියවර ගෙන තිබේ. (බලශක්ති පරිභෝජනය මනිනු ලබන ආකාරය විස්තර කර බලශක්ති පරිභෝජනය පෙන්වන වාර්තා සපයන්න. පරිභෝජනය අවම කිරීම සඳහා ගෙන ඇති පියවර හා වියදම අවම කර ඇති ආකාරය නිරූපණය කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අපි විවිධ බලශක්ති ප්‍රභවයන් අනුව (උදා - ග්‍රිඩ් විදුලිය, පුනර්ජනනීය බලශක්ති ප්‍රභව ආදිය) මාසික බලශක්ති පරිභෝජනය පිළිබඳ වාර්තා තබා ගනිමු. | | | | |
| 6.3 | **හරිතාගාර වායු විමෝචනය:** ආයතනය විසින් පාලනය කරනු ලබන සියලුම ප්‍රභවයන්ගෙන් පිටවන සැලකිය හැකි මට්ටකින් යුක්ත හරිතාගාර වායු විමෝචනය හඳුනාගෙන, හැකි සෑම විටම ගණනය කර ඒවා වළක්වා ගැනීමට හෝ අවම කිරීමට ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කෙරේ. ආයතනයේ ඉතිරි විමෝචන සඳහා හානිපූරණය කිරීම දිරිමත් කරනු ලැබේ. (හරිතාගාර වායු විමෝචන හඳුනා ගැනීම, ගණනය කිරීම සහ වළක්වා ගැනීම හෝ අවම කිරීම සිදු කරන ආකාරය පිළිබඳ සාරාංශ කර සාක්ෂි සපයන්න. ඉතිරි විමෝචන සඳහා හානිපූරණය සිදුකරන ආකාරය විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අපගේ ව්‍යාපාරික මෙහෙයුම් හේතුවෙන් සිදුවන හරිතාගාර වායු විමෝචනය පිළිබඳව අපි දනිමු | | | | |
| | ii. අපගේ ව්‍යාපාරික මෙහෙයුම් හේතුවෙන් සිදුවන හරිතාගාර වායු විමෝචනය අපි ගණනය කර තිබේ | | | | |

| නිර්ණායක අංකය | නිර්ණායක මාතෘකාව | 25% | 50% | 75% | 100% |
|---|---|---|---|---|---|
| 6.4 | **පුනර්ජනනීය බලශක්තිය:** පුනර්ජනනීය බලශක්ති භාවිතය වැඩි කිරීමට උත්සාහ කරයි. ඔබේ පුනර්ජනනීය බලශක්ති භාවිතය වැඩි කිරීමට ගෙන ඇති පියවර මොනවාදැයි විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න. (උදා: බලශක්ති ගිවිසුමේ/ඉන්වොයිසයේ පිටපත). | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |
| 6.5 | **බලශක්ති ඉතිරිකිරීමේ පිළිවෙත්:** LED බල්බ සහ බලශක්ති ඉතිරිකිරීම සඳහා උපදෙස් ලබාදීම වැනි බලශක්ති භාවිතය අවම කරන උපකරණ සහ භාවිතයන් ක්‍රියාත්මක කිරීම. (ඔබේ බලශක්ති ඉතිරිකිරීමේ උපකරණ සහ භාවිතයන් විස්තර කරන්න. කහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |
| 6.6 | **පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයා:** ස්වකීය පුනර්ජනනීය බලශක්තිය (සූර්ය, සුළං, ජෛව) නිෂ්පාදනය කරයි හෝ සූර්ය ජල තාපක යොදයි. (නිපදවන පුනර්ජනනීය බලශක්තියේ වර්ගය සහ ප්‍රමාණය විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |

| නිර්ණායක අංකය | නිර්ණායක මාතෘකාව | 25% | 50% | 75% | 100% |
|---|---|---|---|---|---|
| 6.7 | **විදුලි මෝටර් රථ:** පුනර්ජනනීය බලශක්තියෙන් බල ගැන්වෙන මුළුමනින්ම විදුලියෙන් ධාවනය වන විදුලි මෝටර් රථ පමණක් භාවිතා කරයි. (භාවිතා කරන ලද වාහනවලින් කොපමණ ප්‍රමාණයක් මුළුමනින්ම විදුලියෙන් ධාවනය වන්නේද සහ ඒවා සදහා භාවිතා කරන බලශක්ති වර්ගය විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |
| 6.8 | **ක්‍රිප්ටෝ-මුදල්:** ක්‍රිප්ටෝ-මුදල් ගනුදෙනු ඒවායේ ඉහළ බලශක්ති භාවිතය නිසා සිදුකරනු නොලැබේ. (කිසියම් ක්‍රිප්ටෝ මුදල් ගනුදෙනුවක් සිදුකරනු ලබන්නේද යන්න සඳහන් කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඔබගේ ව්‍යාපාර ක්‍රියාවලිය තුළ ක්‍රිප්ටෝ මුදල් ගනුදෙනු පිළිගන්නේද යන්න සඳහන් කරන්න. | | | | |
| 6.9 | **ශුද්ධ ශුන්‍ය සහතිකය:** සත්‍ය වත්මන් කාබන් පියසටහන, ශුද්ධ ශුන්‍ය අවම කිරීමේ සැලැස්මක් තහවුරු කරන අතර ස්වාධීන සහතිකකරණයක් හෝ රක්ෂණ වාර්තාවකින් ශුද්ධ ශුන්‍ය සහතිකයක් හරහා සමාගමේ පාර්ශවකරුට ශුද්ධ ශුන්‍යය සාක්ෂාත් කර ගැනීමට සහ නිරූපණය කිරීමට හැකි වේ. (ශුද්ධ ශුන්‍ය සහතිකය සම්බන්ධයෙන් සවිස්තර තොරතුරු සපයන්න. (සමාගම ශුද්ධ ශුන්‍ය බව තහවුරු කරන ස්වාධීන සහතිකය හෝ තහවුරු කිරීමේ වාර්තාව අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |
| 6.10 | **දේශගුණික අනුවර්තනය:** දේශගුණික හදිසි අවස්ථා වල අපේක්ෂිත බලපෑම් වලට එරෙහිව සටන් කිරීමට සහ සමාජීය හා පරිසර හිතකාමී ආකාරයෙන් දේශගුණික තත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව සහ අනුවර්තනය වීමේ  හැකියාව වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කෙරේ. (දේශගුණික හදිසි අවස්ථා වල අපේක්ෂිත බලපෑම් වලට එරෙහිව සටන් කිරීමට සහ දේශගුණික තත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව සහ අනුවර්තනය වීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා සමාජීය සහ පරිසර හිතකාමී ආකාරයෙන් ක්‍රියාත්මක කරන ක්‍රියාමාර්ග මොනවාදැයි විස්තර කරන්න.තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |

| නිර්ණායක අංකය | නිර්ණායක මාතෘකාව | 25% | 50% | 75% | 100% |
|---|---|---|---|---|---|
| **7** | **අපද්‍රව්‍ය (කසළ)** | | | | |
| 7.1 | **ඉවත දැමිය හැකි ද්‍රව්‍ය අවම කිරීම:** එක් වරක් භාවිතා කර ඉවත දැමිය හැකි ද්‍රව්‍ය (විශේෂයෙන් ප්ලාස්ටික්) භාවිතා කිරීම වළක්වන අතර ඒ වෙනුවට නැවත භාවිත කළ හැකි විකල්ප ඉදිරිපත් කරයි (උදා. හැඳි ගෑරුප්පු). (ඉවත දැමිය හැකි ද්‍රව්‍ය භාවිතය අවම කරන ආකාරය සහ ලබා දෙන විකල්ප මොනවාද යන්න විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අපි බොහෝ විට දේශීයව ලබා ගත හැකි සහ දේශීයව නිෂ්පාදනය කරන නිෂ්පාදන (පිඟන්, කුණු බඳුන් යනාදිය) භාවිතා කරන අතර, හැකි සෑම විටම ප්ලාස්ටික් භාවිතා නොකරමු. | | | | |
| | ii. අපද්‍රව්‍ය අවම කිරීම සඳහා නිෂ්පාදනවල ආයු කාලය අපි සලකා බලමු. | | | | |
| 7.2 | **අපද්‍රව්‍ය අඩු කිරීම:** ආහාර අපද්‍රව්‍ය ඇතුළු අපද්‍රව්‍ය මනිනු ලබන අතර අපද්‍රව්‍ය අවම කිරීම සඳහා යාන්ත්‍රණයන් ක්‍රියාත්මක වේ. (අපද්‍රව්‍ය මනින ආකාරය සහ අවම කරන ආකාරය විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණ විස්තර කරන්න. (අපි අපගේ ආහාර අපද්‍රව්‍ය මැනීම සහ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම මගින් අපද්‍රව්‍ය අවම කිරීමට කටයුතු කරමු) | | | | |
| 7.3 | **අපද්‍රව්‍ය වෙන් කිරීම:** අපද්‍රව්‍ය අවම කිරීමට නොහැකි අවස්ථාවලදී අපද්‍රව්‍ය නැවත භාවිත කිරීමට හෝ ප්‍රතිචක්‍රීකරණය කිරීමට යාන්ත්‍රණ ක්‍රියාත්මක වේ. (කුමන ආකාරයේ අපද්‍රව්‍ය කෙසේද නැවත භාවිතාවට ගනු ලබන්නේ ද සහ ප්‍රතිචක්‍රීකරණය කරනු ලබන්නේ ද යන්න විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අපි අපද්‍රව්‍ය වෙන් කර, කාබනික අපද්‍රව්‍ය කොම්පෝස්ට් බවට පත් කර, අපද්‍රව්‍ය එකතු කරන්නන්ට විකිණීමට හෝ භාරදීමට කටයුතු කරමු. | | | | |
| 7.4 | **අපද්‍රව්‍ය බැහැර කිරීම:** සියළු අවශේෂ අපද්‍රව්‍ය බැහැර කිරීම ප්‍රාදේශීය ජනගහනයට හෝ පරිසරයට අහිතකර බලපෑමක් ඇති නොකරයි. (අවශේෂ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමය සහ අහිතකර බලපෑම් වළක්වා ගන්නා ආකාරය විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අන්තරායකර අපද්‍රව්‍ය කළමනාකරණය කරන ආකාරය විස්තර කරන්න. | | | | |

| නිර්ණායක අංකය | නිර්ණායක මාතෘකාව | 25% | 50% | 75% | 100% |
|---|---|---|---|---|---|
| 7.5 | **එන්ජින් ඔයිල් භාවිතය:** වගකීම් සහිත ලෙස තෙල් ගබඩාකරණය, ප්‍රතිචක්‍රීකරණය, නැවත භාවිතා කිරීම සහ එන්ජින් ඔයිල් බැහැර කිරීම. (භූගත) ජලයට කිසිඳු තෙල් කාන්දුවක් සිදු නොවන බව සහතික කරයි. (එන්ජින් ඔයිල් ගබඩා කරන, ප්‍රතිචක්‍රීකරණය කරන, නැවත භාවිත කරන හෝ බැහැර කරන ආකාරය විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |
| 7.6 | **අපද්‍රව්‍ය ගබඩා කිරීම සහ බැහැර කිරීම:** අපද්‍රව්‍ය ආරක්ෂිතව ගබඩා කිරීම, වෙන් කිරීම සහ වගකීම් සහගත ලෙස බැහැර කිරීම, ප්‍රාදේශීය ජනගහනයට හෝ පරිසරයට අහිතකර බලපෑමක් ඇති නොකරයි. (අපද්‍රව්‍ය ගබඩා කරන, වෙන් කරන සහ බැහැර කරන ආකාරය විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අපද්‍රව්‍ය වෙන් කර විකිණීම හෝ එකතුකරන්නන් වෙත භාරදීම සිදු කෙරේ. | | | | |
| 7.7 | **එක් වරක් පමණක් භාවිතා කරන බෝතල් නැත:** නළ ජලය (ආරක්ෂිත) පානය කිරීම ප්‍රවර්ධනය කරන අතර නැවත භාවිත කළ හැකි බෝතල් වලට ජලය නැවත පිරවීමට ප්‍රවේශය සපයයි, බෝතල් කළ ජලය ලබා නොදේ. (නල ජලය පානය කිරීම ප්‍රවර්ධනය කරන්නේද යන්න සහ ප්ලාස්ටික් හෝ නැවත භාවිත කළ හැකි ජල බෝතල් පිරිනමන්නේද යන්න විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අපි වීදුරු/කඩදාසි වතුර බෝතල්, කෝප්ප, ආදිය භාවිතා කරන අතර ප්ලාස්ටික් බෝතල්, කෝප්ප ආදිය අඩු කිරීමට පොදු ජල පහසුකම් ඇත. | | | | |
| 7.8 | **ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවන්:** මූලික අපද්‍රව්‍ය වෙන් කිරීමෙන් ඔබ්බට ගිය ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවන් සඳහා ක්‍රියාකාරීව සංවිධානය කිරීම හෝ සහභාගී වීම. (ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවන් විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. පසුගිය වසර කිහිපය තුළ ප්‍රතිචක්‍රීකරණය සිදු කර ඇති ආකාරය පිළිබඳ උදාහරණ සපයමින් විස්තර කරන්න. | | | | |

| නිර්ණායක අංකය | නිර්ණායක මාතෘකාව | 25% | 50% | 75% | 100% |
|---|---|---|---|---|---|
| **8** | **ජලය** | | | | |
| 8.1 | **ජල සංරක්ෂණය:** ජල පරිභෝජනය අවම කිරීමට සහ ජල දූෂණය වැළැක්වීමට පියවර ගනී. (ජල පරිභෝජනය අවම කිරීමට සහ ජල දූෂණය වැළැක්වීමට ගෙන ඇති පියවර විස්තර කරන්න. තහවුරු කරන පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ජල මූලාශ්‍ර විස්තර කරන්න | | | | |
| | ii. අපි වැසි ජලය රැස්කර භාවිතා කරමු | ඔව් | | නැත | |
| 8.2 | **ජල පරිභෝජනය:** ජල අවදානම තක්සේරු කරනු ලබන අතර ජල පරිභෝජනය ජල මූලාශ්‍ර වර්ගය අනුව මනිනු ලැබේ. එමෙන්ම සමස්ත පරිභෝජනය අවම කිරීමට පියවර ගනු ලැබේ. ජල මූලාශ්‍ර තිරසාර වන අතර පාරිසරික ප්‍රවාහයන්ට අහිතකර ලෙස බලපාන්නේ නැත. ඉහළ ජල අවදානම් සහිත ප්‍රදේශවල, සන්දර්භය මත පදනම් වූ ජල භාරකාරත්ව ඉලක්ක හඳුනාගෙන ඒවා අනුගමනය කරනු ලැබේ. (ජල අවදානම තක්සේරු කරන ආකාරය, මූලාශ්‍ර වර්ගය අනුව ජල පරිභෝජනය අධීක්ෂණය කිරීම, ජල මූලාශ්‍ර තිරසාරද යන්න සහ, අදාළ නම්, ජල භාරකාරත්වය පිළිබඳ සාරාංශ කර සාක්ෂි සපයන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |
| 8.3 | **මලාපවහන ජලය පිරිපහදු කිරීම:** මලාපවහනය ජල පිරිපහදු පද්ධතියට සම්බන්ධ කර ඇත (හෝ ආරක්ෂිත සෙප්ටික් ටැංකිය / පොඟවන වළ විකල්පය). (මලාපවහන ජලය බැහැර කරන ආකාරය විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |

| නිර්ණායක අංකය | නිර්ණායක මාතෘකාව | 25% | 50% | 75% | 100% |
|---|---|---|---|---|---|
| 8.4 | **ජලය සුරැකීමේ උපාංග:** වැසිකිලි, කරාම සහ ජලමල් වැනි දෑ ජල පරිභෝජනය අඩු කරන ආකාරයෙන් සැකසී ඇත. (ජල සුරැකිමේ උපාංග ලැයිස්තුගත කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |
| 8.5 | **තුවා/ලිනන් සෝදන ප්‍රතිපත්තිය:** තුවා සහ ලිනන් මාරු කළ යුත්තේ කවදාදැයි සඳහන් කිරීමට අමුත්තන් උනන්දු කරනු ලැබේ (වඩාත් සුදුසු වන්නේ ඔවුන් රැඳී සිටින කාලයෙන් පසුව), එසේ නොමැතිනම් එය සතියකට දෙවතාවකට සීමා කළ යුතුය. (තුවා/ලිනන් සෝදන ප්‍රතිපත්තිය සාරාංශ කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අපි ඉහත කරුණ ක්‍රියාත්මක කරන අතර කාමරවල දැන්වීම් ප්‍රදර්ශනය කෙරේ. | | | | |
| 8.6 | **ජලය නිවරැදිව භාවිතා කිරීම:** අළු ජලය ඇතුළු අපජලය ඵලදායී ලෙස පිරිපහදු කරන අතර දේශීය ජනගහනයට හෝ පරිසරයට කිසිදු අහිතකර බලපෑමක් නොමැතිව නැවත භාවිතා කිරීම හෝ ආරක්ෂිතව මුදා හැරීම පමණක් සිදුකෙරේ. (අපජලය ඵලදායී ලෙස පිරිපහදු කර ආරක්ෂිතව නැවත භාවිතා කරන හෝ මුදා හරින ආකාරය විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |
| **9** | **දූෂණය සහ කරදර** | | | | |
| 9.1 | **දූෂණ නොමැත:** ශබ්දය, ආලෝකය, ගලායාම, ඛාදනය, ඕසෝන් ක්ෂය කරන ද්‍රව්‍ය සහ වාතය, ජලය සහ පාංශු අපවිත්‍ර ද්‍රව්‍ය වලින් සිදුවිය හැකි දූෂණය අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනේ. (ඕනෑම ආකාරයක දූෂණයක් අවම කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග සාරාංශ කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |

| නිර්ණායක අංකය | නිර්ණායක මාතෘකාව | 25% | 50% | 75% | 100% |
|---|---|---|---|---|---|
| 9.2 | **වායු දූෂණය නැත:** වායු දූෂණයට හේතු විය හැකි හේතු හඳුනාගෙන ඒවා වැළැක්වීමට හෝ අවම කිරීමට පියවර ගනී. (වායු දූෂණය වීමට තුඩු දිය හැකි හේතු සහ ඒවා වැළැක්වීමට හෝ අවම කිරීමට ගෙන ඇති පියවර මොනවාද යන්න ලැයිස්තුගත කරන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |
| 9.3 | **හානිකර ද්‍රව්‍ය:** පළිබෝධනාශක, තීන්ත, පිහිනුම් තටාක විෂබීජ නාශක සහ පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය ඇතුළු හානිකර ද්‍රව්‍ය භාවිතය අවම කර, හැකි සෑම අවස්ථාවකදීම හානිකර නොවන නිෂ්පාදන හෝ ක්‍රියාවලි මගින් ආදේශ කරනු ලැබේ. සියලුම ගබඩා භාවිතය, හැසිරවීම සහ රසායනික ද්‍රව්‍ය බැහැර කිරීම නිසි ලෙස කළමනාකරණය කර ඇත. (භාවිතා කරන ලද කිසියම් හානිකර ද්‍රව්‍යයක් සහ ඒවා අවම කළ හෝ ආදේශ කළ ආකාරය හඳුනා ගන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |

| නිර්ණායක අංකය | නිර්ණායක මාතෘකාව | 25% | 50% | 75% | 100% |
|---|---|---|---|---|---|
| 10 | **සොබාදහම සහ දර්ශන** | | | | |
| 10.1 | **සොබාදහමට හිතකාමී:** ජෛව විවිධත්ව සංරක්ෂණයට සහය මෙන්ම දායකත්වය සපයයි. ස්වභාවික පරිසර පද්ධතිවලට සිදුවන සියළු බාධාවන් අවම කර පුනරුත්ථාපනය කරන අතර සංරක්ෂණ කළමනාකරණය සඳහා හානිපූරණ කිරීම සඳහා දායකත්වයක් සැපයේ. (ජෛව විවිධත්ව සංරක්ෂණය සහ ස්වභාවික පරිසර පද්ධති ආරක්ෂා කිරීම සඳහා ඔබ සහාය දක්වන ආකාරය සහ දායක වන ආකාරය විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ස්වභාවධර්මයෙන් සහ ජෛව විවිධත්වයෙන් ඔබ සෘජුවම ප්‍රතිලාභ ලැබූ ප්‍රමාණය විස්තර කරන්න. | | | | |
| | ii. ප්‍රාදේශීයව සහ ඉන් ඔබ්බට සංරක්ෂණයට ඔබ දායක වන ආකාරය විස්තර කරන්න. | | | | |
| 10.2 | **ආක්‍රමණශීලී විශේෂ:** ආක්‍රමණශීලී විශේෂ ඇතුළුවීම වැළැක්වීමට පියවර ගනී. විශේෂයෙන්ම ස්වභාවික භූ දර්ශන තුළ, හැකි සෑම තැනකම භූමි අලංකරණය සහ ප්‍රතිසංස්කරණය සඳහා දේශීය විශේෂ භාවිතා කරනු ලැබේ. (දේපල සඳහා භාවිතා කර ඇති සියළු ස්වදේශික නොවන විශේෂ සහ ආක්‍රමණශීලී විශේෂ ඇතුළුවීම වැළැක්වීමට ගෙන ඇති ක්‍රියාමාර්ග ලැයිස්තුගත කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |

| නිර්ණායක අංකය | නිර්ණායක මාතෘකාව | 25% | 50% | 75% | 100% |
|---|---|---|---|---|---|
| 10.3 | **සත්ව සුභසාධනය:** බලයලත් සහ සුදුසු ලෙස සන්නද්ධ පුද්ගලයින් විසින් මිස හා දේශීය හා ජාත්‍යන්තර නීතියට අනුකූලව නිසි ලෙස නියාමනය කරන ලද ක්‍රියාකාරකම් හැර, කිසිදු වන සත්ව විශේෂයක් අත්පත් කර ගැනීම, අභිජනනය කිරීම හෝ රඳවා තබා ගැනීම සිදු නොකෙරේ. සියලුම වන සතුන් සහ ගෘහස්ථ සතුන් සඳහා වාසස්ථාන, රැකවරණය සහ හැසිරවීම සත්ව සුභසාධනයේ ඉහළම ප්‍රමිතීන් සපුරාලයි. (කිසියම් වන සතෙකු අත්පත් කර ගෙන තිබේද, අභිජනනය කරන්නේද, හෝ රඳවා තබා තිබේද යන්න විස්තර කරන්න. එමෙන්ම සියලු සතුන්ගේ වාසස්ථාන, රැකවරණය සහ හැසිරවීම සත්ව සුභසාධන ප්‍රමිතීන්ට අනුකූල වේ ද යන්න සඳහන් කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |
| | ii. අපි තර්ජනයට ලක් වී ඇති / අවදානමට ලක්විය හැකි සත්ත්ව හෝ වෘක්ෂලතා විශේෂවලින් සාදන ලද කිසිදු අයිතමයක් ප්‍රදර්ශනය නොකරමු. | | | | |
| 10.4 | **වනජීවී සමග අන්තර්ක්‍රියා:** වනජීවීන්ට එල්ලවිය හැකි සමුච්චිත බලපෑම් සැලකිල්ලට ගනිමින්, නිදහසේ සැරිසරන වනජීවීන් සමඟ අන්තර්ක්‍රියාවේ නියැළීම, ආක්‍රමණශීලී නොවන අයුරින් සිදුවන අතර අදාළ සතුන්ට සහ වනයේ සිටින ගහනයේ ශක්‍යතාව සහ හැසිරීම් කෙරෙහි අහිතකර බලපෑම් වළක්වා ගැනීම සඳහා වගකීමෙන් යුතුව කළමනාකරණය කරයි. (වනජීවීන් සමග අන්තර්ක්‍රියා සම්බන්ධ ඔබේ ප්‍රතිපත්තිය සහ මෙය අමුත්තන්ට සන්නිවේදනය කරන ආකාරය සාරාංශ කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |
| 10.5 | **ස්වභාවික සංචාරක ස්ථාන වෙත පැමිණීම:** අහිතකර බලපෑම් අවම කර ගැනීමට සහ නරඹන්නන්ගේ තෘප්තිය උපරිම කිරීමට ස්වභාවික ස්ථාන වෙත පැමිණීම් කළමනාකරණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා සුදුසු මාර්ගෝපදේශ අනුගමනය කරන්න. (ස්වාභාවික ස්ථාන වෙත පැමිණීම පිලිබඳව සහ ඒවා අමුත්තන්ට සන්නිවේදනය කරන ආකාරය පිලිබඳව අනුගමනය කරන ලද මාර්ගෝපදේශ සාරාංශ කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |

| **නිර්ණායක අංකය** | **නිර්ණායක මාතෘකාව** | **25%** | **50%** | **75%** | **100%** |
|---|---|---|---|---|---|
| 10.6 | **ජෛව විවිධත්ව කළමනාකරණය:** තමන්ගේ දේපලට අදාල වන අයුරින් ජෛව විවිධත්වය හා සම්බන්ධ සුදුසු කළමනාකරණයක් ඇත. ස්වභාවික ආරක්ෂිත ප්‍රදේශ සහ ඉහළ ජෛව විවිධත්ව වටිනාකමක් ඇති ප්‍රදේශ කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ. (දේපලවල ජෛව විවිධත්වය කළමනාකරණය කරන ආකාරය සහ ආරක්ෂිත ප්‍රදේශ සහ ඉහළ ජෛව විවිධත්ව වටිනාකමක් ඇති ප්‍රදේශ ඇතුළත් නම් ඒවා පිළිබඳව විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ව්‍යාපාරික පරිශ්‍රය තුළ අපි කිසිදු ක්‍රියාකාරකමක් සඳහා ආක්‍රමණශීලී විශේෂ භාවිතා නොකරමු | | | | |
| | ii. භූගෝලීය ප්‍රදේශයේ දක්නට ලැබෙන සත්ත්වයින් සහ වෘක්ෂලතා විශේෂවල ස්වභාවික වාසස්ථාන තවදුරටත් පැවතිය නොහැක සහ රෝපණය විය නොහැකි මට්ටමෙන් වෙනස් කිරීමට ව්‍යාපාරික ස්ථානවල අපි කටයුතු කර නොමැත. | | | | |
| 10.7 | **වනජීවී වෙළෙඳාම:** වනජීවී විශේෂවල ප්‍රයෝජනය තිරසාර බවකින් යුක්ත බව සහ දේශීය හා ජාත්‍යන්තර නීතිවලට අනුකූල බව සහතික කරමින් නියාමනය කරන ලද ක්‍රියාකාරකමක කොටසක් ලෙස හැර, වනජීවී විශේෂයන් මිනිස් අවශ්‍යතා සඳහා යොදාගැනීම, පරිභෝජනය කිරීම, ප්‍රදර්ශනය කිරීම, විකිණීම හෝ වෙළඳාම් කිරීම සිදු නොකෙරේ. (යම් වනජීවී විශේෂයක් මිනිස් අවශ්‍යතා සඳහා යොදා ගනු ලබන්නේ ද, පරිභෝජනය කරන්නේද, ප්‍රදර්ශනය කරන්නේද, විකුණන්නේද, වෙළඳාම් කරන්නේද යන්න සඳහන් කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |
| 10.8 | **ප්‍රාදේශීය සංරක්ෂණ කටයුතු:** රජයේ හෝ පෞද්ගලික හෝ ප්‍රජා සංවිධාන විසින් මෙහෙයවනු ලබන වනජීවී සංරක්ෂණ සහ අධීක්ෂණ කටයුතුවලට සහභාගී වේ. (ඔබ සහභාගී වන සියළු වනජීවී සංරක්ෂණ සහ අධීක්ෂණ ක්‍රියාකාරකම් විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. සිදු කර ඇති දේ විස්තර කරමින් ඉහත කරුණ විස්තර කරන්න. | | | | |

| නිර්ණායක අංකය | නිර්ණායක මාතෘකාව | 25% | 50% | 75% | 100% |
|---|---|---|---|---|---|
| 10.9 | ජෛව විවිධත්වය පිළිබඳ දැනුවත් කිරීම සඳහා දායක වීම | | | | |
| | i. අපි අපගේ පරිශ්‍රයේ දැනුවත් කිරීමේ පෝස්ටර් ප්‍රදර්ශනය කරන අතර ඒවා නිවැරදිව විස්තර කිරීමට දැනුවත් වී සිටිමු. | | | | |
| | Ii. ජෛව විවිධත්වය පිළිබඳ දැනුවත් කිරීම සඳහා ඔබ සහභාගී වන/ දායක වන ආකාරය විස්තර කරන්න. | | | | |
| 10.10 | ගොඩනැගිලි සහ යටිතල පහසුකම්: ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සැලසුම් කිරීම, ස්ථානගත කිරීම, සැලසුම් කිරීම, ඉදිකිරීම, ප්‍රතිසංස්කරණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ කඩා ඉවත් කිරීම යනාදිය ස්වභාවික හා සංස්කෘතික වටපිටාවේ ධාරිතාවය සහ අඛණ්ඩතාවය සැලකිල්ලට ගනිමින් ප්‍රාදේශීයව සුදුසු සහ තිරසාර භාවිතයන් සහ ද්‍රව්‍ය භාවිතා කරමින් සිදුකෙරේ. (ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේදී ස්වභාවික හා සංස්කෘතික වටපිටාව සලකා බැලූ ආකාරය විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ඉහත කරුණු විස්තර කරන්න. | | | | |
| **11** | **සංස්කෘතික උරුමය** | | | | |
| 11.1 | **සංස්කෘතික හිතකාමී:** පසුගිය වසර 5 තුළ නවීන ව්‍යාපාර සංවර්ධනය උදෙසා දේශීය උරුමයට බරපතල ලෙස හානි කර නැත. (පසුගිය වසර 5 තුළ ඔබ දේශීය උරුමයට හානි කර තිබේද යන්න සඳහන් කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අපි අපේ සංස්කෘතිය සහ උරුමය එහි අව්‍යාජ වටිනාකම (නැටුම්, කලා සහ ශිල්ප) ආරක්ෂා කරමින් ප්‍රවර්ධනය කරමු | | | | |

| නිර්ණායක අංකය | නිර්ණායක මාතෘකාව | 25% | 50% | 75% | 100% |
|---|---|---|---|---|---|
| 11.2 | සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම: ඓතිහාසික, පුරාවිද්‍යාත්මක, සංස්කෘතික හා අධ්‍යාත්මික වැදගත්කමකින් යුක්ත දේශීය දේපල, ස්ථාන සහ සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා දායක වන අතර ප්‍රදේශවාසීන්ට ඒවාට ප්‍රවේශ වීමට බාධාවක් ඇති නොකරමු. | | | | |
| | i. ඓතිහාසික, පුරාවිද්‍යාත්මක, සංස්කෘතික හා අධ්‍යාත්මික වැදගත්කමක් ඇති ප්‍රදේශබද කෞතුක වස්තූන්, ස්ථාන සහ සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා අපි දායක වෙමු. | | | | |
| 11.3 | **අව්‍යාජ (Authentic) අත්දැකීම්:** ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ බුද්ධිමය දේපළ අයිතිවාසිකම්වලට ගරු කරමින් ආයතනයේ මෙහෙයුම්, සැලසුම්, සැරසිලි, ආහාර පිසීම හෝ සාප්පු යනාදියේ සාම්ප්‍රදායික සහ සමකාලීන දේශීය සංස්කෘතියේ අව්‍යාජ අංග අගය කිරීම සහ ඇතුළත් කිරීම. (දේශීය සංස්කෘතියේ අව්‍යාජ අංග ඔබේ මෙහෙයුම් සහ අලංකරණයට ඇතුළත් කර ඇති ආකාරය විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අපි කිසිදු අංශයක් වෙනස් නොකර අව්‍යාජ සංස්කෘතික අත්දැකීම් ප්‍රවර්ධනය කර ආරක්ෂා කරමු. | | | | |
| | Ii. අපි ප්‍රදේශබද ප්‍රජාවන්ගේ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කර අගය කරමු. | | | | |
| 11.4 | **සංස්කෘතික අන්තර්ක්‍රියා:** සිදුවිය හැකි අහිතකර බලපෑම් අවම කිරීමට සහ ප්‍රාදේශීය වශයෙන් ලැබිය හැකි ප්‍රතිලාභ සහ නරඹන්නන් හට උපරිම තෘප්තිය ලබාදීම සඳහා ප්‍රදේශයේ ප්‍රජාව වෙත සහ සංස්කෘතික හෝ ඓතිහාසික වශයෙන් සංවේදී ස්ථාන වෙත සිදුකරන සංචාරක කළමනාකරණය සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර සහ ජාතික යහපරිචයන් (good practices) සහ දේශීයව එකඟ වූ මාර්ගෝපදේශ අනුගමනය කරයි. (ස්වදේශික ප්‍රජාවන් වෙත සහ සංස්කෘතික හෝ ඓතිහාසික වශයෙන් සංවේදී ස්ථාන වෙත පැමිණීමෙන් සිදුවිය හැකි අහිතකර බලපෑම් අවම කිරීමට සහ උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට අනුගමනය කරන යහපරිචයන් සහ මගපෙන්වීම් විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අප විසින් කළමනාකරණය සහ ප්‍රවර්ධනය සඳහා ජාත්‍යන්තර සහ ජාතික යහපරිචයන් හා දේශීයව එකඟ වූ මගපෙන්වීම අනුගමනය කරන අතර ස්වදේශික ප්‍රජාවන් සහ සංස්කෘතික හෝ ඓතිහාසික වශයෙන් සංවේදී ස්ථානවලට ද සංචාරය කරමු. | | | | |
| 11.5 | **සංස්කෘතික අන්තර්ක්‍රියා - නැව් සංචාරක ක්‍රියාකරුවන්:** ස්වදේශික ප්‍රජාවන්ගෙන් සහ සංචාරක නැව් වරායන් සහ ගමනාන්ත අසල පදිංචිකරුවන්ගෙන් කැමැත්ත ලබා ගනු ලැබේ. සංස්කෘතික හෝ ඓතිහාසික වශයෙන් සංවේදී ස්ථාන නැරඹීමේදී අමුත්තන්ගේ යහපරිචයන් ප්‍රවර්ධනය කෙරේ. (ස්වදේශික ප්‍රජාවන්ගෙන් සහ මව් වරායවල් අසල පදිංචිකරුවන්ගෙන් කැමැත්ත ලබා ගත්තේද යන්න සහ අමුත්තන් අතර යහපරිචයන් ප්‍රවර්ධනය කරන ආකාරය යනාදිය විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |

| නිර්ණායක අංකය | නිර්ණායක මාතෘකාව | 25% | 50% | 75% | 100% |
|---|---|---|---|---|---|
| 11.6 | **කෞතුක වස්තු:** දේශීය හා ජාත්‍යන්තර නීතියෙන් අවසර දී ඇති පරිදි හැර ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක කෞතුක භාණ්ඩ විකිණීම, වෙළඳාම් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම සිදු නොකෙරේ. (කිසියම් ඓතිහාසික හෝ පුරාවිද්‍යාත්මක කෞතුක භාණ්ඩ විකුණන්නේද, වෙළඳාම් කරන්නේද හෝ ප්‍රදර්ශනය කරන්නේද යන්න විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. දේශීය හා ජාත්‍යන්තර නීතියෙන් අවසර දී ඇති පරිදි මිස ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක කෞතුක භාණ්ඩ විකිණීම, වෙළඳාම් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම සිදු නොකෙරේ. | | | | |
| **12** | **තොරතුරු** | | | | |
| 12.1 | **තිරසාරභාවය වාර්තාකිරීම:** පාරිභෝගිකයන් ඇතුළු පාර්ශවකරුවන්ට ආයතනයේ තිරසාර ප්‍රතිපත්ති, ක්‍රියාකාරකම් සහ කාර්ය සාධනය ප්‍රසිද්ධියේ සන්නිවේදනය කරන අතර ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීමට උත්සාහ කරයි. (ඔබේ තිරසාර ප්‍රතිපත්තිය, ක්‍රියාකාරකම් සහ කාර්ය සාධනය ඔබ ප්‍රසිද්ධියේ සන්නිවේදනය කරන ආකාරය විස්තර කරන්න. අදාළ නම් වෙබ් පිටුවට සබැඳිය ඇතුළත් කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අපි අපගේ ආයතනයේ තිරසාරභාවය පිලිබඳ දැනුම් දීමට කටයුතු කරමු (බලශක්ති භාවිතය සහ කසළ උත්පාදනය) | | | | |
| | ii. අපි අපගේ සියලුම අමුත්තන්, සේවකයින් සහ සැපයුම්කරුවන් සඳහා අපගේ තිරසාර ප්‍රතිපත්ති ප්‍රදර්ශනය කරමු | | | | |
| 12.2 | **තිරසාරභාවය කළමනාකරණ කිරීමේ ක්‍රමය:** ආයතනයේ විශාලත්වයට සහ විෂය පථයට ගැලපෙන දිගුකාලීන තිරසාරභාවය කළමනාකරණ කිරීමේ ක්‍රමයක් ක්‍රියාවට නංවා ඇති අතර පාරිසරික, සමාජීය, සංස්කෘතික, ආර්ථික, ගුණාත්මක, මානව හිමිකම්, සෞඛ්‍ය, ආරක්ෂාව, අවදානම් සහ අර්බුද කළමනාකරණ යනාදී ගැටළු ආමන්ත්‍රණය කර අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සිදු කරයි. (ඔබේ දිගුකාලීන තිරසාරභාවය කළමනාකරණය කිරීමේ ක්‍රමය සාරාංශ කර එහි විෂය පථය, ඉලක්ක, තේමාවන් සහ ආමන්ත්‍රණය කර ඇති ගැටළු විස්තර කරන්න. තිරසාරභාවය කළමනාකරණය කිරීමේ ක්‍රමය පිළිබඳ සාක්ෂි අමුණන්න.) | | | | |
| | i. දිගු කාලීන තිරසාර මෙහෙයුම් සඳහා තිරසාරසාරභාවය කළමනාකරණය කිරීමේ ක්‍රමයක් අප සතුව ඇත. | | | | |
| 12.3 | **තිරසාරභාවය පිලිබඳ වාර්තාව:** මෙම සහතික කිරීමේ ක්‍රියා පටිපාටියේ තිරසාරභාවය පිලිබඳ වාර්තාව (හෝ පෙර ඕනෑම සහතිකයක්) අන්තර්ජාලය හරහා හෝ සේවාදායකයින්ට විවෘතව ලබා දීම තුලින් ප්‍රසිද්ධ කර තිබේ. (දෙවන වසරේ සිට අදාළ වේ). (ඔබගේ තිරසාරභාවය පිලිබඳ වාර්තාව ප්‍රසිද්ධ කරනු ලැබූ හෝ එසේ කිරීමට බලාපොරොත්තු වන ආකාරය විස්තර කරන්න. අදාළ නම් වෙබ් පිටුවට සබැඳියක් ඇතුළත් කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. තිරසරභාවය පිලිබද වාර්තාව අපගේ වෙබ්අඩවියෙන් ලබා ගත හැක. | | | | |
| 12.4 | **නිරවද්‍ය ප්‍රවර්ධනය:** තිරසාරභාවය හා බැඳි හිමිකම් ඇතුළුව ආයතනය සහ එහි නිෂ්පාදන සහ සේවාවන් සම්බන්ධයෙන් ප්‍රවර්ධන ද්‍රව්‍ය සහ අලෙවිකරණ සන්නිවේදනයන් නිරවද්‍ය සහ විනිවිදභාවයෙන් යුක්ත වේ. ඔවුන් ලබා දෙනවාට වඩා වැඩි යමක් පොරොන්දු වන්නේ නැත. (ප්‍රවර්ධන ද්‍රව්‍ය සහ අලෙවිකරණ සන්නිවේදනයන්හි, විශේෂයෙන්ම තිරසාරභාවය සම්බන්ධයෙන් නිරවද්‍යතාවය සහ විනිවිදභාවය සහතික කරන ආකාරය විස්තර කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ආයතනය සහ එහි නිෂ්පාදන සහ සේවාව සම්බන්ධයෙන් අපගේ ප්‍රවර්ධන ද්‍රව්‍ය සහ අලෙවිකරණ සන්නිවේදනයන් නිරවද්‍ය සහ විනිවිදභාවයෙන් යුක්ත වේ. | | | | |

| **නිර්ණායක අංකය** | **නිර්ණායක මාතෘකාව** | **25%** | **50%** | **75%** | **100%** |
|---|---|---|---|---|---|
| 12.5 | **ස්වභාවධර්මය සහ සංස්කෘතිය පිළිබඳ තොරතුරු:** ස්වභාවික වටපිටාව, දේශීය සංස්කෘතිය සහ සංස්කෘතික උරුමයන් පිළිබඳ තොරතුරු සහ අර්ථ නිරූපණය මෙන්ම ස්වභාවික ප්‍රදේශ, සජීවී සංස්කෘතීන් සහ සංස්කෘතික උරුම ස්ථාන නැරඹීමේදී පිළිපැදිය යුතු සුදුසු හැසිරීම් පිළිබඳ පැහැදිලි කිරීමක් සපයයි. (ඔබ ප්‍රදේශයේ ස්වභාවය සහ සංස්කෘතිය, මෙන්ම අමුත්තන් සඳහා හැසිරීම් මාර්ගෝපදේශ පිළිබඳ තොරතුරු සපයන ආකාරය විස්තර කරන්න. අදාළ නම් වෙබ් පිටුවට සබැඳිය ඇතුළත් කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අපි ස්වභාවික වටපිටාව, දේශීය සංස්කෘතිය සහ සංස්කෘතික උරුමයන් පිළිබඳ තොරතුරු සහ අර්ථ නිරූපණය සපයන්නෙමු. | | | | |
| | ii. ස්වභාවික ප්‍රදේශ, සජීවී සංස්කෘතීන් සහ සංස්කෘතික උරුම ස්ථාන නැරඹීමේදී සුදුසු හැසිරීම් පිළිබඳ පැහැදිලි කිරීමක් අපි සපයන්නෙමු. | | | | |
| 12.6 | තිරසාරභාවය පිළිබඳ තොරතුරු: නවාතැන්, ආපනශාලා, ආහාර සහ පානවර්ග, විනෝද චාරිකා, සංචාර සහ ගමනාන්තය වෙත පිවිසීම සහ එහි ඇතුළත ප්‍රවාහනය සම්බන්ධ තිරසාර විකල්ප පිළිබඳව අමුත්තන්ට දැනුම් දෙනු ලැබේ. (ඔබ ප්‍රාදේශීය තිරසාර ක්‍රියාකාරකම්, ව්‍යාපාර සහ ප්‍රවාහනය පිළිබඳ තොරතුරු සපයන ආකාරය විස්තර කරන්න. අදාළ නම් වෙබ් පිටුවට සබැඳිය ඇතුළත් කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. නවාතැන්, ආපනශාලා, ආහාර සහ පානවර්ග, විනෝද චාරිකා, සංචාර සහ චාරිකා සහ ගමනාන්තය වෙත සහ ගමනාත්නය ඇතුළත ප්‍රවාහනය සම්බන්ධ තිරසාර විකල්ප පිළිබඳව අමුත්තන්ට දැනුම් දෙනු ලැබේ. | | | | |
| 12.7 | සෞඛ්‍යය සහ ආරක්ෂාව පිළිබඳ තොරතුරු: ගමනාන්තයේ සෞඛ්‍ය සහ ආරක්ෂිත කරුණුවලට අදාළ ඕනෑම අවදානම් සහ පූර්වාරක්ෂාවන් පිළිබඳව අමුත්තන්ට දැනුම් දෙනු ලැබේ. (ඔබ ගමනාන්තයේ සෞඛ්‍යය සහ ආරක්ෂාව පිළිබඳ තොරතුරු සපයන ආකාරය විස්තර කරන්න. අදාළ නම් වෙබ් පිටුවට සබැඳිය ඇතුළත් කරන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. ගමනාන්තයේ සෞඛ්‍ය සහ ආරක්ෂිත කරුණු සම්බන්ධ යම් අවදානම් සහ පූර්වාරක්ෂාවන් තිබේනම් ඒවා පිළිබඳව අමුත්තන්ට දැනුම් දෙනු ලැබේ. | | | | |
| 12.8 | **පාරිභෝගික අත්දැකීම්:** තිරසාරත්ව අංග ඇතුළුව පාරිභෝගික තෘප්තිය නිරීක්ෂණය කරනු ලබන අතර නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලැබේ. (විශේෂයෙන් තිරසාරභාවය සම්බන්ධයෙන් අවධානය යොමුකරමින් ඔබ පාරිභෝගික තෘප්තිය නිරීක්ෂණය කරන ආකාරය විස්තර කර නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගන්නා ආකාරය පිළිබඳ උදාහරණ සපයන්න. තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න.) | | | | |
| | i. අපි පාරිභෝගික ප්‍රතිපෝෂණ ලබා ගනිමින් ඒවා නිරීක්ෂණය කර නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනිමු | | | | |

| **නිර්ණායක අංකය** | **නිර්ණායක මාතෘකාව** | **25%** | **50%** | **75%** | **100%** |
|---|---|---|---|---|---|
| 12.9 | ඔබ කරනු ලබන වෙනත් දේවල් මොනවා ද? නීත්‍යානුකූලව අවශ්‍ය නොවන හෝ පෙර නිර්ණායකවලින් ආවරණය නොවන වෙනත් වැදගත් ක්‍රියාමාර්ග හෝ පියවර මොනවාද? මීට පෙර සඳහන් කර නොමැති තිරසාරත්වයට අදාළ වෙනත් ක්‍රියාමාර්ග හෝ ඔබ ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව ඔබට වාර්තා කළ හැක.<br><br>තහවුරු කිරීමේ පින්තූර හෝ ලේඛන අමුණන්න. | | | | |